# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1570/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 12/10/2024 පැය 0855

**මාධ්‍ය නිවේදනය**

**විදේශ ගමන් බලපත්‍ර ලබාගැණීම සඳහා ව්‍යාජ ලේඛන සැකසූ සැකකරුවෙකු, සැකකාරියක් හා එම ව්‍යාජ ලේඛණ සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය .**

ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා පැමිණෙන පුද්ගලයන් හට ප්‍රමුඛතාවය මත සේවය ලබා දීම සඳහා බස්නාහිර පළාත් දකුණ නියෝජ්‍ය පොලිස්පති විසින් වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාවට නංවන ලදි.

ඒ අනුව විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා පැමිණෙන මහජතාව හට ප්‍රමුඛතාවය මත සේවය ලබා ගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත්හි බස්නාහිර පළාත් දකුණ නියෝජ්‍ය පොලිස්පතිගේ නිල මුද්‍රව තබා දිනය හා ප්‍රමුඛතා අංකයක් ලබාදීම සිදු කර ගෙන යන ලදි. එම නිළ මුද්‍රාව ව්‍යාජ ලෙස යොදා විදේශ ගමන් බලපත්‍රය ලබා ගැනීම සඳහා ව්‍යාජ අයදුම්පතක් සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයෙකු 2024.10.11 වන දින අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී වංචනික ලෙස මෙම අයදුම්පත් සකසන ලද සැකකරුවෙකු හා සැකකාරියක් ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රය ආසන්නයේදී තලංගම පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මෙම ලේඛන ව්‍යාජ ලේඛන සකස්කරන ලද බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි පුද්ගලික ආයතනයේ තිබූ ලැප්ටොප් පරිඝනක යන්ත්‍ර 02ක්, ප්‍රින්ටරයක්, ස්කෑනර් යන්ත්‍රයක් හා අන් සතු විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමේ අයදුම් පත්‍ර 02 ක් පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 31 වයස්වල පසුවන බඩල්කුඹුර, අංගොඩ හා නුගේගොඩ යන ප්‍රදේශවල පදිංචි අයවලුන් වේ.**

මෙම ව්‍යාජ ලේඛන සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයා විසින් එම ලේඛණ සකස්කරවා ගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රය අසල සිටි තැරැව්කරුවෙකු හට රුපියල් 45,000/- ක මුදලක් ලබාදී ඇති බවටද විමර්ශන වලදී අනාවරණය වී ඇති අතර එම තැරැව්කරුද අත්අඩංගුවට ගැනීම සඳහා තලංගම පොලිසිය විසින් විමර්ශන සිදු කරනු ලබයි.

විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිනෙණ මහජනතාව මෙවැනි වංචනික පුද්ගලයින්ට හසු නොවන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය